**කොවිඩ්- 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල - 2021**

-----------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 මතය**

-------

කොවිඩ් - 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි, කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2020 අගෝස්තු 29 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයෙන් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 876(2) (අ) ප්‍රකාරව | 2020 අප්‍රේල් 16 දින ආරම්භ කර තිබූ මෙම අරමුදල සඳහා එදින සිට වර්ෂයක් ඇතුළත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව ප්‍රකාරව ලබාගත යුතු පාර්ලිමේන්තු අනුමැතිය විගණිත දිනය වූ 2022 ජූලි 18 දින වන විටත් ලබාගෙන නොතිබුණි. | මේ වන විට කොවිඩ් -19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල වසා දැමීම පිළිබඳ අවධානය යොමු වී ඇත . | පාර්ලිමේන්තු අනුමැතිය ලබාගත යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.274,070,004 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,672,798,912 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,398,728,908 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රදාන රු.1,450,109,993 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 පෙබරවාරි 19 දිනැති කළමනාකරණ කමිටුවේ තීරණය ප්‍රකාරව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද නව යෝජනාවක් පරිදි සෞඛ්‍ය | 2021 පෙබරවාරි 19 දිනැති කළමනාකරණ කමිටු තීරණය ප්‍රකාරව සෞඛ්‍ය උපදේශනාත්මක සංඥා කණු (signposts) 500 ක් මාර්ග ආශ්‍රිතව සවි කිරීම සඳහා කොවිඩ් | කළමනාකරණ කමිටු තීරණ ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය |

| | | | |
|---|---|---|---|
| | උපදේශනාත්මක සංඥා කණු (signposts) 500 ක් මාර්ග ආශ්‍රිතව සවි කිරීමට තීරණය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එලෙස උපදේශනාත්මක සංඥා කණු සවි කිරීමට සුදුසු අනුග්‍රාහකයකු පත්කර නොතිබුණු අතර, කමිටුවේ තීරණය පරිදි සවි කළ යුතු සංඥා කණු සවි කර නොතිබුණි. | 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලෙන් මූල්‍ය ප්‍රතිපාදන නිකුත් කර නොමැත. | |
| (ආ) | 2021 ජුනි 25 දිනැති කළමනාකරණ කමිටුවේ වාර්තාව ප්‍රකාරව 1990 - සුවසැරිය ගිලන් රථ සේවාව සඳහා ගිලන් රථ 60 ක් මිලදී ගැනීම සඳහා රු. මිලියන 408.43 ක මූල්‍ය ප්‍රතිපාදන අරමුදලින් සැලසීමට තීරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී ගිලන්රථ මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි. | දිවයිනේ පවතින වර්තමාන තත්ත්වය හේතුවෙන් හා 2022.04.26 දිනැතිව නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව රාජ්‍ය වියදම් සීමා කර ඇති බැවින්, මෙතෙක් මිලදී ගැනීමේ කටයුතු ආරම්භ කර නොමැති නිසා මෙම ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවන බව ප්‍රාථමික සෞඛ්‍ය සේවා ,වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයෙන් දන්වා ඇත. | කළමනාකරණ කමිටු තීරණ ක්‍රියාත්මක කළ යුතු වීම. |
| (ඇ) | 2021 ඔක්තෝබර් 29 දිනැති කළමනාකරණ කමිටුවේ වාර්තාව ප්‍රකාරව කොවිඩ්-19 වසංගතය හේතුවෙන් තම දෙමාපියන් අහිමි වූ දරුවන් සඳහා අධ්‍යාපන ශිෂ්‍යත්ව පිරිනැමීමට තීරණය කර තිබුණද, එම අධ්‍යාපන ශිෂ්‍යත්ව පිරිනැමීමේ වැඩසටහන සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි. | ගිණුම වසා දැමීමට අවශ්‍ය මූලික කටයුතු සැලසුම් කරගෙන යන බැවින්, ශිෂ්‍යත්ව පිරිනැමීම සම්බන්ධ තීරණයක් ගැනීමට නොහැක. | කළමනාකරණ කමිටු තීරණ ක්‍රියාත්මක කළ යුතු වීම. |

## 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොවිඩ්-19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල මඟින් පහත සඳහන් අරමුණු ඉටු කළ යුතුව තිබුණි.<br>• ඖෂධ, ඖෂධ පරීක්ෂණ උපකරණ ඇතුළු සෞඛ්‍ය සේවා පහසුකම් සඳහා සහ කොවිඩ්-19 වසංගතයට එරෙහිව සටන් කිරීමට ඇති ධාරිතාවය නඟා සිටුවීමට හදිසි මූල්‍ය අවශ්‍යතා ලබාදීම.<br>• සෞඛ්‍ය සේවා, සෞඛ්‍ය සේවා නිලධාරින්ගේ සහ අත්‍යාවශ්‍ය පොදු සේවා සපයන්නන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා වියදම් දැරීම.<br>• ළමයින්, කාන්තාවන්, අඩු ආදායම් ලබන පුද්ගලයින්, වයස්ගත, ආබාධිත සහ අවදානම් පුද්ගලයින් සඳහා මූලික අවශ්‍යතා සැලසීම.<br>• ගම්බද සහ දුරස්ථ බෙහෙත් ශාලා සඳහා මූල්‍ය පහසුකම් ලබාදෙමින් පොදු සෞඛ්‍ය අංශය ශක්තිමත් කිරීම.<br>• දේශීය අමුද්‍රව්‍ය, සම්පත්, දැනුම සහ නිපුණතා උපයෝගී කරගනිමින් සනීපාරක්ෂක නිෂ්පාදන, නිෂ්පාදනය සහ බෙදාහැරීම සඳහා දේශීය වෛද්‍ය ඒකකවලට උපකාර කිරීම.<br>• උසස් ගණයේ ආරක්ෂිත ඇඳුම් සහ සනීපාරක්ෂක නිෂ්පාදන ගෝලීය වෙළඳපලට සැපයීමට නවෝත්පාදන සහ පරීක්ෂණ ප්‍රවර්ධනය කිරීම.<br><br>2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 1,947ක් වූ අරමුදලේ ශේෂය, ඉහත කී අරමුණු සඳහා උපයෝජනය නොකර බැංකු ජංගම ගිණුමේ රු.මිලියන 06 ක් හා ඉතිරි කිරීමේ ගිණුමේ රු.මිලියන 284.9 ක් ලෙස මුදල් රඳවාගෙන තිබූ අතර ස්ථාවර තැන්පතුවල රු.මිලියන 1,656.10ක් ආයෝජනය කර තිබුණි. | අරමුදලේ අරමුණු යටතට ගැනෙන ව්‍යාපෘති යෝජනා ප්‍රමාණවත්ව නොලැබීම හා අරමුලින් මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමට එකඟ වූ ව්‍යාපෘති අතරමඟ නවතා දැමීම හේතුවෙන් අපේක්ෂා කළ පරිදි වියදම් දැරීමට නොහැකි වී ඇත . | අරමුදලේ අරමුණු ඉටු කිරීම සඳහා අවශ්‍ය මුදල් උපයෝජනයන් කළ යුතු වීම. |